## පළාත් පාලනය

ජපානය පළාත් පාලන කොට්ඨාස 46කට බෙදා ඇත. ටෝකියෝ නගරය මින් එකකි. ප්‍රාදේශීය සභා, නගර සභා සහ ගම් සභා වැනි විවිධ ආයතන මගින් පළාත් පාලන කටයුතු සිදු කරනු ලැබේ.

## අධිකරණය

1889 මෙයිජි ව්‍යවස්ථාව අනුව අධිකරණයේ කටයුතු එක්තරා දුරකට විධායකයට යටත් ව තිබිණි. නව ව්‍යවස්ථාවෙන් අධිකරණය ස්වාධීන ආයතනයක් බවට පත් කෙරිණි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන්ට විශ්‍රාම යන තුරු හෝ දස වසරකට පසු ව හෝ තනතුරෙන් ඉවත් වීමේ පදනම මත සේවය කළ හැකි ය. ඔවුන්ගේ දූෂණ වෙතොත් උභය මන්ත්‍රී මණ්ඩල පරීක්ෂණ කමිටුවකින් ඒ පිළිබඳ ව විමසා බලනු ඇත. ශ්‍රේෂ්ඨාධිකරණය අගවිනිසුරු ප්‍රමුඛ සාමාජික විනිසුරුවරුන් 14 දෙනෙකුගෙන් සමන්විත ය. පහළ උසාවිවල විනිශ්චයකාරවරුන් පත් කරනුයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙනු ලබන නාම ලේඛනය තුළින් කැබිනට් මණ්ඩලය විසිනි.

## විදේශ සම්බන්ධතා

ජපානයේ විදේශ ප්‍රතිපත්තියේ මූලික පරමාර්ථය වන්නේ, දේශීය වශයෙන් සාමය, සමෘද්ධිය, නිදහස ලැබීම සහ ලෝක සාමය සහ මිනිස් වර්ගයාගේ ශුභසාධනයට සහභාගි වීම ය.



රූපය 5.11
මෝටර් රථ නිපදවන රොබෝවරු

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ව 1947 දී නව ව්‍යවස්ථාවක් හඳුන්වා දුන්න ද ජපානය කෙරෙහි මිත්‍ර බලවතුන්ගේ බලපෑම අඛණ්ඩ ව ක්‍රියාත්මක විය.

එසේ ම 1951 දී ජපානය හා එක්සත් ජනපදය ආරක්ෂක සහයෝගිතා ගිවිසුමකට එළඹියේ ය. 1960 දී එය සංශෝධනය කළ අතර මෙම ගිවිසුම යටතේ එක්සත් ජනපද හමුදාවන්ට ජපානයේ රැඳී සිටීමට අවස්ථාව ලැබිණි. 1952 දී ජපානය චීනය සමඟ සාම ගිවිසුමකට එළඹියේ එයට පෙර තිබූ විරුද්ධවාදී තත්ත්වය සමනය කර ගැනීම සඳහා ය. එමෙන් ම ජපානය 1956 දී රුසියාව සමඟ නැවත තානාපති සබඳතා ඇති කොට ගෙන ඇත.

1956 දී ජපානය එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබා එහි ක්‍රියාකාරී සාමාජිකයකු බවට පත් ව ඇත.

තව ද ජපානය ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා රටවල් සමග ආර්ථික සහයෝගීතාව රැකෙන පරිදි කටයුතු කිරීමට පියවර ගෙන ඇත. 1965 දී ජපානය සංවර්ධනය වන රටවලට සැපයූ ආධාර ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 485 කි. ජපානය සිය ජාතික ආදායමෙන් 1%ක් වාර්ෂික ව මෙසේ ආධාර ලබා දීමට වෙන් කර ඇත. 1966 දී ඩොලර් මිලියන 200ක් යොදවමින් ආසියානු සංවර්ධන බැංකුවේ 20%ක් හිමි කර ගත්තේ ය. 1955 දී ජපානය තීරු ගාස්තු සහ වෙළෙඳ කටයුතු පිළිබඳ පොදු ගිවිසුම් හෙවත් ගැට් (GATT) General Agreement on Trade and Tariff සංවිධානයේ සාමාජිකත්වය ලබා ගත්තේ ය. 1964 දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සාමාජිකත්වය ලබා ගත් අතර දිළිඳු රටවලට තාක්ෂණික ඥානය ලබා දීම සඳහා 1966 වන විට රටවල් 18ක පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කෙළේ ය.

## ජපානයේ ආර්ථික සංවර්ධනය

ජපානයට 1960 දී ආර්ථික කටයුතු සඳහා පස් අවුරුදු සැලැස්මක් හඳුන්වා දුන් නමුත් එය 1966 වන විට නිෂ්ප්‍රභ කෙළේ උද්ධමනය ඉහළ යාම නිසා ය. ජපාන වැසියාගේ ප්‍රධාන ආහාරය බත් වූ නිසා ප්‍රධාන වශයෙන් වී වගාව ද ඉරිඟු, බාර්ලි වැනි වගාවන් ද දියුණු කෙරිණි. දෙවන ලෝක යුද්ධයට පෙර ඉඩම් අයිති කොට ගැනීමේ වරප්‍රසාද භුක්ති විඳින ලද රදල පැලැන්තියක් වූ නිසා, ගොවීන් සතුව ඉඩම් නො තිබිණි. නව ව්‍යවස්ථාව මගින් අධිරාජයාගේ බලතල අහෝසි වී යාමත් සමඟ රදල ආධිපත්‍යය ඉබේ ම ගිලිහී ගියේ ය. හඳුන්වා දුන් නව ප්‍රතිසංස්කරණවලින් ගොවීන්ට ඉඩම් හිමි විය. වගා කළ හැකි භූමි ප්‍රමාණය මුළු රටේ බිම් ප්‍රමාණයෙන් 16.2%ක් විය. මේ නිසා අක්කර 2.5ක පමණ කුඩා ගොවිපොළ බිහි විය. වගා කළ හැකි සෑම බිම් අඟලක ම වගා කිරීම විශේෂ ලක්ෂණයකි. ට්‍රැක්ටර් හා වෙනත් යාන්ත්‍රික ගොවි උපකරණ භාවිතය අස්වනු ඉහළ යාමට හේතු වී ඇත. තණබිම් අඩු වීම නිසා කිරි ගව සම්පත පහළ මට්ටමක පවතී. ජපානයේ 1964 වන විට මුළු භූමියෙන් 2/3 වනාන්තර පැවතිණි. එරට දැව අවශ්‍යතා සඳහා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය වැනි රටවලින් දැව ආනයනය කෙරිණි. එමෙන් ම කෘත්‍රිම ව වන වගා කිරීම ද සිදු විය.



රූපය 5.12 හිරෝෂිමා බෝම්බය සිහි ගන්වන සාම උද්‍යානය

අතීතයේ සිට ම ජපානයේ ධීවර කර්මාන්තය පුළුල් මට්ටමක පැවතිණි. 1961-1964 කාලයේ රජය මැදිහත් වීම නිසා ධීවර නිෂ්පාදන ඉහළ ගියේ ය.

ජපානයේ කාර්මිකරණයට බලපෑ ප්‍රධාන හේතුවක් වූයේ විදුලිබලය යි. කඳුවලින් ගහණ අධික වර්ෂාපතනය ඇති රටක් නිසා 1955 වන විට රටේ විදුලි අවශ්‍යතාවෙන් 70% ජල විදුලියෙන් ලබා ගැනිණි. 1968 වන විට ලෝකයේ වැඩි ම ගෘහස්ථ විදුලි

පරිභෝජනය පැවති රට වූයේ ජපානය යි. 1962 දී තාප බලය ද 1965 දී පරමාණු බල ශක්තිය ද යොදා ගෙන විදුලිය නිපදවන ලදී.



රූපය 5.13 ජපානයේ ගෘහස්ථ ක්‍රීඩාංගනය

ජපානය ඛනිජ සම්පත් අතින් ඉතා දුප්පත් රටකි. එහි බහුල ව ඇති ගල් අඟුරු ද භාවිතයට එතරම් සුදුසු නො වේ. මිනිරන්, තුත්තනාගම්, ආසනික්, ගෙන්දගම්, හුණුගල්, සිලිකා, ඩොලමයිට් වැනි ඛනිජ ද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් ඇත. ඛනිජ තෙල් මුළු අවශ්‍යතාවයෙන් 2% ස්වදේශීය ව ලබා ගනු ලැබේ. කෙසේ වුව ද ජපානයට කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය 90%ක් ම පිටරටින් ගෙන්වා ගැනීමට සිදු ව ඇත. එහෙත් ඔවුන්ගේ කර්මාන්ත අංශය සාර්ථක ප්‍රගතියක් ලබාගෙන ඇත.

## කර්මාන්ත දියුණුව

දෙවන ලෝක යුද්ධ සමයේ ජපානයේ කර්මාන්ත මුළුමනින් ම අඩාල විය. යුද්ධයෙන් පසු අවධි තුනක දී කර්මාන්ත දියුණුව දැකිය හැකි ය.

I අවධිය 1945-1952 - ප්‍රතිසංස්කරණ අවධිය - කර්මාන්ත නැවත ගොඩ නැංවී ය.

II අවධිය 1952-1959 - ඒකාබද්ධ කිරීමේ අවධිය - මනා සම්බන්ධයක් පවත්වා ගැනිණි.

III අවධිය 1960-1967 - ප්‍රසාරණ අවධිය - විවිධ කර්මාන්ත කෙරෙහි යොමු විය.



රූපය 5.14 ජපන් තෙල් නැවක්



රූපය 5.15 දුම්රිය පොළක සිටින ජනතාව

ධනවත් ආයෝජකයන් සිටීම කර්මාන්ත ක්ෂේත්‍රය සාර්ථක වීමට හේතු වී ඇත. එ මෙන් ම ජපන් ශ්‍රමිකයන්ගේ දැඩි කැපවීම හා විනයානුකූල භාවය භාණ්ඩවල ගුණාත්මක බව, ලොව පුරා වෙළෙඳ ප්‍රදර්ශනාගාර ඉදිකිරීම, ජර්මනිය හා එක්සත් ජනපදය යන රටවල නිෂ්පාදිත භාණ්ඩවලට වඩා අඩුවෙන් මිල නියම වීම, නවීන තාක්‍ෂණය යොදා ගැනීම වැනි හේතු ජපාන කාර්මීකරණය සාර්ථක වීමට බලපා ඇත.

## ප්‍රකට කර්මාන්ත

- නැව් තැනීම අතින් ලොව දියුණු ම තාක්ෂණය අනුගමනය කරන රටක් ලෙස ජපානය ප්‍රකට ය.
- 1960 දශකය වන විට තෝකයිදෝ නම් ලොව ශීඝ්‍රගාමී දුම්රිය එන්ජිම නිපදවා ආර්ජන්ටිනාව, රුසියාව, සෞදි අරාබිය වැනි රටවලට එය අලෙවි කෙරිණි.
- 1960 දශකයේ දී ජපානයේ නිෂ්පාදිත රූපවාහිනී, රේඩියෝ, ශීතකරණ ඇතුළු ගෘහ විදුලි උපකරණ ලොව ඕනෑ ම රටක දී දැකගැනීමට හැකි විය.



රූපය 5.16 දෙමහල් දුම්රියක්

- ජපානය 1966 දී ලොව දෙවන විශාල ම මෝටර් රථ නිපදවන රට බවට පත් වූ අතර නිපදවන ප්‍රමාණය පහළොස් ගුණයකින් ඉහළ නංවා තිබිණි.
- ජපානයේ යකඩ නොමැති අතර නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය පිටරටින් ගෙන්වා ගනු ලැබේ. එහෙත් මල නොබැඳෙන වානේ නිපදවීම අතින් ලොව තෙවන ස්ථානය 1960 දශකයේ දී ජපානයට හිමි විය.
- ජපන් කැමරා, ඇස් කන්නාඩි, දුරදක්න යනාදිය ඉතා ජනප්‍රිය නිෂ්පාදන වේ.
- ජපානයේ රෙදි විවීමේ උපකරණ ද බොහෝ ආසියාතික රටවල ජනප්‍රිය වී ඇත.

## විදේශ වෙළෙඳාම

ජපානයේ සමස්ත ආර්ථිකය ම රඳා පැවතියේ විදේශ වෙළෙඳාම මත බව පැහැදිලි ය. ජපානය තුළ අමුද්‍රව්‍ය නොමැතිකමින් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍යවලින් 95%කටත් වැඩි ප්‍රමාණයක් ආනයනය කොට ජපානයේ දියුණු කළ තාක්ෂණය අනුව ඒවා නිමි භාණ්ඩ බවට පත් කර නැවත විදේශ වලට අපනයනය කිරීම සිදු වේ. 1961 වන විට ජපාන නිෂ්පාදනවලින් 55%ක් අපනයන වෙළෙඳ පොළ ඉලක්ක කොට ගත් බැර කර්මාන්ත නිෂ්පාදනය විය. ජපන් නිෂ්පාදනවල දැකිය හැකි යහපත් නිමාව, කල් පැවැත්ම වැනි ගුණාත්මක ලක්ෂණ හේතු කොට ජපානයේ නිෂ්පාදිත භාණ්ඩ ලොව පුරා ජනප්‍රිය වී ඇත.



රූපය 5.14 නවීන නිවාස

## සමාජ තත්ත්වය



රූපය 5.18 ජපන් පවුලක්

ජපානය කාර්මීකරණයට නැඹුරු වීම නිසා බොහෝ පිරිස් නගර කරා පැමිණියහ. මේ නිසා 1960 දශකය අවසන් වන විට ජපානය නාගරිකත්වය සුලභ වූ රටක් බවට පත් විය. පීතෘ මූලික සමාජයක් පවතින ජපානයේ නිවාසවලට නව නිපැයුම් එක් වීම නිසා ගේ දොර වැඩ අඩු වී ජපන් කාන්තාවට නිදහස ලැබිණි. මේ නිසා ජපාන කාන්තාව නිෂ්පාදන කටයුතුවලට යොමු විය. නව ව්‍යවස්ථාව අනුව දරුවන් රැක බලා ගැනීමට අධ්‍යාපනය ලබා දීමට ජපානයේ පවුලක පියාට සමාන වගකීමක් මවට ද පැවරී ඇත. ජපානයේ පවුල තුළ පියාට හිමි ආධිපත්‍යය නව ප්‍රතිසංස්කරණවලින් පසු අඩු වී ඇත. ඒ අනුව ජපානයේ තරුණ පිරිසට වඩාත් පුළුල් නිදහසක් හිමි වී ඇත.

## සමාජ සුභසාධනය

දෙවන ලෝක යුද්ධයට පසු ව සිදු වූ කාර්මික දියුණුව හේතු කොට ගෙන කම්කරුවන් එක් වී වෘත්තිය සමිති පිහිටුවා ගනු ලැබී ය. ඒවායේ ඇති විශේෂ ලක්ෂණය වන්නේ සිය යුතුකම් ඉටු කිරීමට ඔවුන් තුළ ඇති දැඩි අධිෂ්ඨානය හා විනය යි. 1965 වන විට වෘත්තීය සමිති 53000 ක් ජපානයේ බිහි විය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව කම්කරු සේවා පහසුකම් දෘශ්‍යමාන ලෙස වර්ධනය වී ඇත.

කාර්මීකරණය සමඟ පරිසර දූෂණය ද පැමිණීම නිසා ජපන් ජනතාවට පරිසරය රැක ගැනීමට ද විශාල මුදලක් වැය කිරීමට සිදු වී ඇත. 1960 දශකය අවසානය වන විට අපවිත්‍ර ජලය නැවත පිරිසිදු කිරීමට හා අපද්‍රව්‍ය කළමනාකරණයට යොමු විය.

දිළිඳු නීති, අංගවිකල හා ළමා සුභසාධන නීති, රැකියාවල නියුතු අයගේ සෞඛ්‍ය රක්ෂණ නීති, පොදු ජන සෞඛ්‍ය රක්ෂණ නීති, සුභසාධන හා විශ්‍රාම රක්ෂණ නීති, මාතෘ හා දාරක රක්ෂණ නීති, මහලු අයගේ සුභසාධන නීති වැනි නීති රැසක් 1950 දශකය වන විට හඳුන්වා දුනි. 1964 වන විට 98.5%කට සෞඛ්‍ය රක්ෂණය ලබා දී තිබිණි.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව උග්‍ර නිවාස හිඟයක් පැවතිණි. 1955 දී රජය නිවාස වැඩ පිළිවෙළට එක්වෙමින් වසරකට නිවාස 300000ක් බැගින් ගොඩ නැංවී ය. 1964 දී නිවාස 843000 ඉදි කළ අතර පුද්ගලික ව නිවාස ඉදිකරන්නන්ට ණය වශයෙන් මිලියන 98513 ක් ලබා දුනි. රජය පළාත් පාලන ආයතන මඟින් නිවාස ඉදි කරවී ය. තට්ටු නිවාස සංකීර්ණ ජපන් ජන ජීවිතය නව මඟකට යොමු කිරීමට බලපා ඇත.